# මීගමුව අධ්‍යාපන කලාපය
# දෙවන වාර ඇගයීම-2025
# භූගෝල විද්‍යාව

විභාග අංකය / නම : ...................................................................................................

| 11 ශ්‍රේණිය | භූගෝල විද්‍යාව I, II | කාලය පැය 03 |
|---|---|---|

## භූගෝල විද්‍යාව I

මෙම ප්‍රශ්න පත්‍රය ප්‍රශ්න **40** කින් සමන්විත ය.

එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති උපදෙස්වලට අනුකූලව **සියලු ම ප්‍රශ්නවලට මෙම ප්‍රශ්න පත්‍රයේ ම** පිළිතුරු සපයන්න.

- **අංක 01 සිට 05 දක්වා ප්‍රශ්නවල එක් එක් හිස්තැනට ගැළපෙන පිළිතුර වරහන් තුළින් තෝරා තිත් ඉර මත ලියන්න.**

01. පෘථිවියේ මතුපිට වර්ග ප්‍රමාණය වර්ග කිලෝමීටර් මිලියන.............................. ( 510 /501/ 590 )

02. පෘථිවි කබොල මහද්වීපික කබොල හා ..................... වශයෙන් කොටස් දෙකකි. ( සාගරික/ හරය / ප්‍රාවරණය )

03. ඕසෝන් ස්ථරය පිහිටා ඇත්තේ ............................. ගෝලයේ ය. ( අපරිවර්තී / පරිවර්තී / මෙසෝ)

04. මැඩගස්කරය ............................. තැටියෙහි පිහිටා ඇත. ( අප්‍රිකානු / උතුරු ඇමරිකානු / යුරෝපා )

05. ලොව විශාලතම මහාද්වීපය ............................. මහාද්වීපය යි. (අප්‍රිකා / උතුරු ඇමරිකා / ආසියා)

- **අංක 06 සිට 10 තෙක් දී ඇති එක් එක් ප්‍රකාශය නිවැරදි නම් "නි" යන්න වටා ද වැරදි නම් "වැ" යන්න වටා ද රවුමක් අඳින්න.**

06. පරිසර පතන සීඝ්‍රතාව සිදුවන්නේ පරිවර්තී ගෝලයේ ය. **නි / වැ**
07. පැපුවා නිව්ගිනියාව, ඕස්ට්‍රේලියා මහද්වීපික තටකයෙහි පිහිටා ඇති දූපතකි. **නි / වැ**
08. මැඩගස්කරය හා ඉතාලියේ පෝ ගංගා නිම්නය ආසියාවෙන් බැහැරව වී වගාකරන ප්‍රදේශවලට උදාහරණ වේ. **නි / වැ**
09. කුෂ්නෙට්ස්ක් කලාපය චීනයේ යකඩ හා වානේ නිෂ්පාදනය සඳහා වැදගත්වන ප්‍රදේශයකි. **නි / වැ**
10. වනාන්තර හා සරු පස ක්ෂය වන ස්වභාවික සම්පතක් වේ. **නි / වැ**

- **අංක 11 සිට 16 තෙක් ප්‍රශ්නවලට හිස්තැන් සඳහා සුදුසු වචන යොදා සම්පූර්ණ කරන්න.**

11. ශාකපත්‍ර හා සතුන්ගෙන් වායුගෝලයට ජලය එකතු වීම................................ ලෙස හඳුන්වයි.

12. තේ පර්යේෂණායතනය................................ හී පිහිටා ඇත.

13. හග්ගල,යාල හා රිටිගල ...................................... තුනකි.

14. ශ්‍රී ලංකාවේ කෘෂි තාක්ෂණික උයන පිහිටා ඇත්තේ..................................... දිස්ත්‍රික්කයේ ය.

15. කබොක් මිශ්‍ර රතු පස....................................... වගාව සඳහා යෝග්‍ය පස් වර්ගයක් වෙයි.

16. භූමි කම්පා................................................... උපද්‍රවයකි.

- අංක **17** සිට **19** තෙක් ප්‍රශ්නවලට හිස්තැන් පිරවීම සඳහා පහත දී ඇති ප්‍රස්ථාරය උපයෝගී කරගන්න.

<u>ආයෝජන මණ්ඩලයේ ලියාපදිංචි ව්‍යවසායවල විදේශීය සෘජු ආයෝජන (ඇමෙරිකානු ඩොලර් මිලියන)</u>




17. විදේශීය සෘජු ආයෝජන අඩුම අංශය කුමක් ද?……………………………………

18. ………………………ප්‍රමාණයක් 2022 දී යටිතල පහසුකම් වෙනුවෙන් සිදු වූ විදේශීය ආයෝජන වේ.

19. 2021 ට සාපේක්ෂව 2022 දී සේවා අංශයෙහි විදේශ සෘජු ආයෝජන ප්‍රමාණයන්හි වෙනස කොපමණ ද ?
……………………………….

- අංක 20 සිට 24 තෙක් දී ඇති ප්‍රශ්නවල "අ" හා "ආ" යනුවෙන් තීරු දෙකක් දැක්වේ. "අ" තීරුවේ ඇති තොරතුරු අනුපිළිවෙලින් "ආ" තීරුවේ ඇති තොරතුරු හා ගැළපූ විට නිවැරදි අනුපිළිවෙල දැක්වෙන පිළිතුරට හිමි අංකය ඉදිරියේ ඇති තිත් ඉරි මත ලියන්න.

**20**

| අ | | ආ |
|---|---|---|
| ගංගා | | ගංගා පිහිටි මහාද්වීප |
| 1.නයිල් ගඟ | A | ආසියාව |
| 2.ඇමසන් ගඟ | B | අප්‍රිකාව |
| 3.ඉන්දු ගඟ | C | උතුරු ඇමරිකාව |
| | D | දකුණු ඇමරිකාව |

**(1) A,B,C** **(2) B,D,A** **(3) D,C,B** **(3) A,C,D** (……....)

**21.**

| අ | | ආ |
|---|---|---|
| කර්මාන්ත | | කර්මාන්ත පිහිටි ප්‍රදේශ |
| 1.වෙස්මුහුණු | A | පිළිමතලාව |
| 2.වේවැල් භාණ්ඩ | B | කොග්ගල |
| 3.පිත්තල කැටයම් | C | අම්බලන්ගොඩ |
| | D | රඳාවඩුන්න |

(1) B,C,A (2) C,B,D (3) A,C,B (4) C,D,A (………)

**22.**

| අ | | ආ |
|---|---|---|
| කෘෂි භෝගය | | භෝගය සඳහා අවශ්‍ය පස් වර්ගය |
| 1.වී | A | වර්නසොම් පස |
| 2.තිරිඟු | B | දියලු පස |
| 3.රබර් | C | ලවන මිශ්‍ර වැලි පස |
| | D | කබොක් මිශ්‍ර රතු පස |

(1) A,B,C　　(2) B,C,D　　(3) B,A,D　　(4) D,B,A　　(............)

23.

| අ | ආ | |
|---|---|---|
| එළවළු වගා කරන විශේෂිත කලාපය | එම කලාපවලට ආවේනික වූ එළවළු වර්ගය | |
| 1.වියලි කලාපය | A | ලීක්ස් |
| 2.තෙත් කලාපය | B | මුරුංගා |
| 3.කඳුරට කලාපය | C | මැකරල් |
| | D | මාළු මිරිස් |

(1) B,C,A　　(2) A,C,B　　(3) B,D,A　　(4) A,B,C　　(………)

24.

| අ | | ආ |
|---|---|---|
| වනාන්තරය | | වනාන්තරවල විශේෂිත ලක්ෂණ |
| 1. කේතුදර වනාන්තර | A | පැළෑටි වර්ධනය වේගයෙන් සිදු වේ |
| 2.සෞම්‍ය කලාපික වනාන්තර ය | B | ඉදිකටු වැනි ශාක පත්‍ර ඇත |
| 3.නිවර්තන වර්ෂා වනාන්තර ය | C | සදාහරිත මෙන්ම පතනශීලී ගස් ද ඇත |
| | D | පතොක් ශාක දක්නට ලැබේ |

(1) A,B,C　　(2) B,C,A　　(3) D,C,B　　(4) C,B,A　　(……….)

- **අංක 25හේ සිට 40 තෙක් ඇති එක් එක් ප්‍රශ්නයට දී ඇති වර්ණ අතුරින් නිවැරදි හෝ වඩාත් ගැලපෙන හෝ පිළිතුර තෝරා ඊට හිමි අංකය ඉදිරියේ ඇති තිත් ඉරි මත ලියා දක්වන්න.**

25. මාංශ භෝග සඳහා පුහුණු මධ්‍යස්ථානය පිහිටා ඇති ප්‍රදේශය වන්නේ,
    (1) මාතලේ ය.　　(2) බතලේගොඩ ය.
    (3) ගන්නෝරුව ය.　　(4) අගුණකොළපැලැස්ස ය.　　(……..)
26. එක්සත් රාජධානියේ යකඩ හා වානේ නිෂ්පාදන මධ්‍යස්ථානයක් ලෙස වැදගත් ප්‍රදේශයකි.
    (1) ලැන්කෂයර් ප්‍රදේශය　　(2) දකුණු මැංචූරියා ප්‍රදේශය
    (3) පිටස්බර්ග් කලාපය　　(4) ඔසාකා　　(…….)
27. කෙඔලින් හෙවත් කිරිමැටි නිධි පිහිටි ප්‍රදේශ දෙකක් නිවැරදිව දැක්වෙන පිළිතුර කුමක් ද?
    (1) බොරලැස්ගමුව හා මීටියාගොඩ　　(2) හොරණ හා රත්තොට
    (3) දෙදියවල හා මීපේ　　(4) දංකොටුව හා මීගමුව　　(…….)
28. 1:50000 පරිමාණයට අඳින ලද සිතියම් පත්‍රයක දිග හා පළල පිළිවෙලින් දැක්වෙන පිළිතුර කුමක් ද?
    (1) 8O cm, 50 cm　　(2) 120 cm, 60 cm
    (3) 40 cm, 25 cm　　(4) 70 cm, 40 cm　　(…….)
29. ඉන්ධනමය ඛනිජයක් ඇතුළත් නිවැරදි වරණය වන්නේ,
    (1) මිනිරන් ය.　　(2) හුණුගල් ය.　　(3) යපස් ය.　　(4) ගල් අඟුරු ය.　　(……)
30. ලෝක මිනිරන් නිෂ්පාදනයෙන් 60% ක් නිපදවන රට කුමක් ද?
    (1) ඉන්දියාව　　(2) බ්‍රසීලය　　(3) ටැන්සානියාව　　(4)ශ්‍රී ලංකාව　　(…….)
31. ලොව විශාලතම නිවර්තන වැසි වනාන්තරය පිහිටි මහාද්වීපය වන්නේ
    (1) උතුරු ඇමෙරිකාව ය.　　(2) දකුණු ඇමරිකාව ය.　　(3) ආසියාව ය. (4) යුරෝපය ය.
    (……..)
32. වියලි කලාපයට පමණක් සීමා වූ පාංශු ගණය වන්නේ,
    (1) රතු දුඹුරු පස ය.　　(2) රතු දුඹුරු ලැටසෝල් පස ය.
    (3) දියළු පස ය.　　(4) රතු කහ ලැටසෝල් පස ය.　　(……..)

33. බලංගොඩ හා මීරිගම යන ප්‍රදේශවල ව්‍යාප්තව ඇති ඛනිජ වැලි වර්ගය පහත පිළිතුරු අතුරෙන් කුමක් ද?

(1) සිලිකා (2) රූටයිල් (3) සර්කෝන් (4) ඉල්මනයිට් (…....)

34. ශ්‍රී ලංකාවේ භූගත ජල ද්‍රෝණිවලට කදිම නිදසුනක් වන්නේ

(1) මුලුන්කාවිල් ය. (2) යාපනය යි (3) ගම්පහ ය. (4) මාතලේ ය. (…….)

35. ලෝක ජන සංඛ්‍යාවෙන් 60% ක් පමණ ජීවත්වන මහද්වීපය කුමක ද?

(1) අප්‍රිකා (2) උතුරු ඇමරිකාව (4)දකුණු ඇමරිකා (4) ආසියා (…….)

36. ශ්‍රී ලංකාවේ වැඩිම ජන සංඛ්‍යාවක් වාසය කරන හා අඩුම ජන සංඛ්‍යාවක් වාසය කරන දිස්ත්‍රික්ක දෙක පිළිවෙලින් ඇතුළත් නිවැරදි වරණය කුමක් ද?

(1) ගම්පහ හා යාපනය (2) රත්නපුර හා ගාල්ල

(3) කොළඹ හා මුලතිව් (4) කොළඹ හා මන්නාරම (…….)

37.සංවර්ධනය මැනීම සඳහා භාවිතා කරන නූතන මිනුමකි

(1) මානව සංවර්ධන දර්ශකය (2) මූර්ත දළ ජාතික නිෂ්පාදිතය

(3) දළ ජාතික නිෂ්පාදිතය (4) දළ ජාතික නිෂ්පාදනයේ වර්ධන වේගය (…....)

- **පහත A, B, C හා D මගින් දක්වා ඇති එකිනෙකට සම්බන්ධ මාතෘකා යුගල හොඳින් අධ්‍යයනය කොට අංක 38 සිට 40 තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න .**

| | | | |
|---|---|---|---|
| A- | ගෝලීය උෂ්ණත්වය වැඩිවීම<br>කාබන්ඩයොක්සයිඩ් | B- | සූර්යය බලශක්ති භාවිතය<br>වායු දූෂණය |
| C- | වියපත් ජන සංඛ්‍යාව<br>සුභසාධක වියදම් | D- | භූමි කම්පා<br>සුනාමි |

38.දෙවැන්නේ වැඩිවීම පළමුවැන්නේ වැඩිවීමට හේතුවන මාතෘකා යුගලය කුමක් ද ?

(1) A (2) B (3) C (4) D (……..)

39.පළමුවැන්නේ වැඩිවීම දෙවැන්නේ වැඩිවීමට හේතුවන මාතෘකා යුගලය කුමක් ද?

(1) A (2) B (3) C (4) D (…….)

40 දෙවැන්නේ ඇතිවීමට පළමුවැන්න හේතුවක් විය හැකි මාතෘකා යුගලය කුමක් ද?

(1) A (2) B (3) C (4) D (…….)

(ලකුණු 1 X 40=40)

## භූගෝල විද්‍යාව II

- මෙම ප්‍රශ්න පත්‍රය I හා II වශයෙන් කොටස් **දෙකකින්** සමන්විත ය.
- I කොටසේ ප්‍රශ්නය අනිවාර්ය වේ එහි "අ" . "ආ" සහ "ඉ" **කොටස් තුනට ම** පිළිතුරු සැපයිය යුතු ය.
- II කොටසින් ප්‍රශ්න **හතරකට** පිළිතුරු සැපයිය යුතු ය.
- පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව **පහකි.**

### I කොටස

**1.** අ) ඔබ වෙත සපයා ඇති ශ්‍රී ලංකා 1:50000 භූ ලක්ෂණ සිතියම් කොටස අධ්‍යයනය කර ඒ ඇසුරෙන් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. පිළිතුරු ලිවීම සඳහා ඔබ වෙත සපයා ඇති කඩදාසිය යොදාගන්න.

- **අංක i සිට iv දක්වා ඇති ප්‍රශ්නවලට ගැළපෙන පිළිතුර වරහන් තුළින් තෝරා ලියන්න.**

i. A අක්ෂරයෙන් දක්වා ඇත්තේ කුමක්ද?
(බොක්ක/ තුඩුව/ මෝය) (ලකුණු 01 යි)

ii. B අක්ෂරයෙන් දක්වා ඇති ලක්ෂණය කුමක්ද?
( කලපුව/බොක්ක/වෙරළ) (ලකුණු 01 යි)

iii. C අක්ෂරයෙන් දක්වා ඇති ලක්‍ෂණය මින් කුමක් ද?
(තුඩුව/ ගංගා මෝය/ කලපුව) (ලකුණු 01 යි)

iv. D අක්ෂරයෙන් දැක්වෙන පරිපාලන මායිම කුමක් ද?
(දිස්ත්‍රික් මායිම/ පළාත් මායිම/ ග්‍රාම නිලධාරී කොට්ඨාස මායිම) (ලකුණු 01 යි))

- **සිතියම් ප්‍රදේශය අධ්‍යයනය කොට v සිට ix දක්වා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න.**

v. E අක්ෂරයෙන් දක්වා ඇති පරිපාලන මායිම නිවැරදිව නම් කරන්න (ලකුණු 01 යි)

vi. F අක්ෂරයෙන් දක්වා ඇති ලක්ෂණය නිවැරදිව හඳුනාගෙන ලියන්න (ලකුණු 01 යි)

vii. G අක්‍ෂරයෙන් දක්වා ඇති චතුරස්‍රාකාර ප්‍රදේශය තුළ දක්නට ලැබෙන කෘෂි භූමි පරිභෝග දෙකක් නම් කරන්න (ලකුණු 02 යි)

viii. දකුණු අර්ධයේ වෙරළබඩ ප්‍රදේශ ආශ්‍රිතව වැඩි වශයෙන් ව්‍යාප්තව පවතින වැව්ලි භෝගය කුමක් ද? (ලකුණු 01 යි)

ix. ඊසාන කාර්තුවේ ජනාවාස අඩුවීමට එක් හේතුවක් නම් කරන්න. (ලකුණු 01 යි)

(ආ) ඔබවෙත සපයා ඇති පිටු අංක 8 හි ලෝක සිතියම හොඳින් අධ්‍යයනය කර පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න පිළිතුරු සැපයීම සඳහා ලෝක සිතියමට යාබදව ඇති තීරුව යොදාගන්න.

| | | | |
|---|---|---|---|
| i. | ඇන්ඩීස් කඳුවැටිය | G,H,I | |
| ii. | ගංගානම් ගඟ | A,B,C | |
| iii. | කැස්පියන් මුහුද | D,E,F | |
| iv. | මලක්කා සමුද්‍ර සන්ධිය | J,K,L | |
| v. | ටෝකියෝ නගරය | M.N.O | (ලකුණු 05 යි) |

(ඉ) සපයා ඇති පිටු අංක 8 හි ශ්‍රී ලංකා සිතියම හොඳින් අධ්‍යයනය කර පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. පිළිතුරු සැපයීම සඳහා ශ්‍රී ලංකා සිතියමට යාබදව ඇති තීරුව යොදාගන්න.

| | | | |
|---|---|---|---|
| i. | මන්නාරම් දූපත | P,Q,R | |
| ii. | මාතලේ දිස්ත්‍රික්කය | E,F,G | |
| iii. | නිලාවේලි වෙරළ | H,I,J | |
| iv. | විල්පත්තු ජාතික වනෝද්‍යානය | K,L,M | |
| v. | හලාවත සිලිකා වැලි නිධිය | N,O,P | (ලකුණු 05 යි) |

## II කොටස

**2.** (i) පෘථිවි වායුගෝලීය ස්ථර අතුරෙන්

a) පතන සීඝ්‍රතාව සිදුවන වායුගෝලීය ස්ථරයේ නම ද,

b) ඕසොන් ස්ථරය පිහිටා ඇති ස්ථරයේ නම ද ලියා දක්වන්න. (ලකුණු 02 යි)

(ii) වායුගෝලයේ වැදගත්කම කරුණු තුනක් ඇසුරෙන් ලියා දක්වන්න . (ලකුණු 03 යි)

(iii) වර්තමානයේ වායුගෝලය දූෂණය වීම ගෝලීය ගැටලුවක් බවට පත්ව තිබේ. වායු දූෂණය සිදුවන මිනිස් ක්‍රියාකාරකම් තුනක් නම් කර වායු දූෂණය නිසා ඇතිවන බලපෑම මොනවාදැයි කෙටියෙන් විස්තර කරන්න (ලකුණු 05 යි)

**3.** (i) ආසියාවෙන් බැහැර වී වගා කරන ප්‍රදේශ දෙකක් නම් කරන්න (ලකුණු 02 යි)

(ii) a). වී වගාව සඳහා වැදගත් වන පස් වර්ගය ද

b) ලෝකයේ වී වගාව ආශ්‍රිත විශේෂිත ලක්ෂණ දෙකක් ද සඳහන් කරන්න. (ලකුණු 03 යි)

(iii) ශ්‍රී ලංකාවේ ජනතාවට වි වගාව වැදගත් වන්නේ ඇයි? කරුණු තුනක් මගින් පෙන්වා දෙන්න (ලකුණු 05 යි)

**4.** (i) කර්මාන්ත ස්ථානගත වීමට බලපාන සාධක දෙකක් නම් කරන්න (ලකුණු 02 යි)

(ii) a).මොටර් රථ කර්මාන්තට වැදගත් නැගෙනහිර ආසියාතික රටවල් දෙකක් ද,

b).යුරෝපානු රටක් ද නම් කරන්න. (ලකුණු 03 යි)

(iii) a).ශ්‍රී ලංකාවේ මයික්‍රෝ වාහන එකලස් කිරීමේ කර්මාන්ත ශාලාව පිහිටා ඇත්තේ කිනම් ප්‍රදේශයක ද? (ලකුණු 01 යි)

b).ශ්‍රී ලංකාවේ මෝටර් රථ කර්මාන්තය ආශ්‍රිත ගැටලු දෙකක් කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 04 යි)

**5.** (i) ලෝකයේ නිවර්තන වැසි වනාන්තර පවතින ප්‍රදේශ දෙකක් නම් කරන්න. (ලකුණු 02 යි)

(ii) නිවර්තන වැසි වනාන්තරවල දැකිය හැකි ලක්ෂණ තුනක් සඳහන් කරන්න (ලකුණු 03 යි)

(iii) වනාන්තර පෘථිවියේ ජීවනාලියයි. වනාන්තර පෘථිවි වැසියාගේ පැවැත්ම ආරක්ෂා කරයි වනාන්තරවල වැදගත්කම කරුණු තුනක් මගින් දක්වා වනාන්තර හා වනජීවීන් මුහුණපාන ගැටලුවක් කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 05 යි)

**6.** (i) ලොව ජනාධික කලාප අතුරෙන් දෙකක් නම් කරන්න. (ලකුණු 02 යි)

(ii) a).ජන සංඛ්‍යාවේ අසම ව්‍යාප්තියට බලපාන භෞතික සාධක දෙකක් ද

b). මානව සාධකයක් ද නම් කරන්න (ලකුණු 03 යි)

(iii). a).ශ්‍රී ලංකාවේ ජන සංඛ්‍යාව වැඩිම දිස්ත්‍රික්කය හා අඩුම දිස්ත්‍රික්කය නම් කරන්න. (ලකුණු 02 යි)

b).බස්නාහිර පළාත අධික ජන සංඛ්‍යාවකින් යුක්ත වීමට බලපෑ හේතුවක් සඳහන් කර කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 03 යි)

**7.** (i) සංවර්ධනය යන්නෙන් අදහස් වන්නේ කුමක්ද? (ලකුණු 02 යි)

(ii) a).සංවර්ධනය මැනීමේ පැරණි මිනුමක් ද

b).සංවර්ධනය මැනීමේ නූතන මිනුම් දෙකක් ද නම් කරන්න. (ලකුණු 03 යි)

(iii) වර්තමාන ශ්‍රී ලංකා රජය ප්‍රාදේශීය සංවර්ධනය වෙනුවෙන් වැඩි අවධානයක් යොමු කොට තිබේ. මෙරට ප්‍රාදේශීය සංවර්ධනය වෙනුවෙන් විවිධ රජයන් ගෙන ඇති පියවර තුනක් කෙටියෙන් සාකච්ඡා කරන්න.

(ලකුණු 05 ය

**8.** ලෝකයේ ස්වාභාවික විපත් කිහිපයක් පහත දැක්වේ.

a. භූමිකම්පා
b. වසංගත රෝග
c. ළැව්ගිනි
d. නියග

ඉහත ස්වාභාවික විපත් අතුරෙන්,

(i) a). භූ විද්‍යාත්මක උපද්‍රවයක්

හා

b). දේශගුණික උපද්‍රවයක් නම් කරන්න. (ලකුණු 02 යි)

(ii) a). භූමිකම්පාවක් යනු කුමක්දැයි කෙටියෙන් හඳුන්වන්න. (ලකුණු 01 යි)

b). පහත සිතියමෙහි දක්වා ඇත්තේ ලෝකයේ භූමිකම්පා ඇති වන ප්‍රධාන කලාපයි.A හා B ලෙස දක්වා ඇති භූමිකම්පා කලාප නම් කරන්න.. (ලකුණු 02 යි)




මූලාශ්‍රයය: අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව, භෞතික භූගෝල විද්‍යාව (2009)

(iii) භූමිකම්පාවලින් ඇතිවන බලපෑම් තුනක් නමකර ඉන් එකක් විස්තර කරන්න. (ලකුණු 05 යි)

I කොටස

1 (ආ)




(i)

(ii)

(iii)

(iv)

(v)

(ඉ)




(i)

(ii)

(iii)

(iv)

(v)

**I කොටස, (1) ප්‍රශ්නය (අ) සඳහා පිළිතුරු ලිවීමට මෙම කඩදාසිය යොදාගන්න**

පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය පිණිසයි

i. ..........................................................................................................

ii. ..........................................................................................................

iii. ..........................................................................................................

iv. ..........................................................................................................

v. ..........................................................................................................

vi. ..........................................................................................................

vii. ..........................................................................................................

viii. ..........................................................................................................

ix. ..........................................................................................................

10